# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2302/24 - 2022 ඔක්තෝබර් මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2022.10.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් භාණ්ඩ ප්‍රවාහනය කරන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත**

1972 අංක 10 දරන (සංශෝධිත) නැව් නියෝජිතයන්ට, නැව් භාණ්ඩ ප්‍රවාහනය කරන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනතේ 10 වැනි වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**නිමල් සිරිපාල ද සිල්වා,**
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2017.10.17 දිනැති *අති විශෙෂ ගැසට්* අංක 2041/1 මගින් ප්‍රකාශයට පත් කරන ලද නැව් නියෝජිතයන්ගේ, නැව් භාණ්ඩ ප්‍රවාහනය කරන්නන්ගේ, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ගේ සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ගේ (ගාස්තු ව්‍යුහය) නියෝග පහත දැක්වෙන ලෙස 2022.11.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කර ඇත.

1. නියෝග 03 හි "එකම" යන වචනය පසුව වහාම "මෙම නියෝගයන්හි 5 වන නියෝගයෙහි විධිවිධානවලට යටත්ව" යන වචන ඇතුළත් කිරීම.

2. 05 වැනි නියෝගයෙහි අතුරු විධානය අවලංගු කිරීම සහ මතු සඳහන් දේ ආදේශ කිරීම;

   සපයා ඇති, ඕනෑම බලපත්‍රලාභී සේවා සපයන්නෙකු ආනයනකරුගෙන් බෙදාහැරීමේ ඇණවුම් ගාස්තුවක් අය කළ යුතු අතර එය මෙම නියෝගයෙහි 1 වැනි උපලේඛනයෙහි I කොටසෙහි දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා රුපියල් වලින් ගෙවි යුතු ය.

1A - PG 6011— 356 (2022/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එසේ වුවද, තවදුරටත් සේවා සපයන්නා විසින් උපලේඛනයේ II කොටසෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි අවසාන තොග භාරකරුගෙන් පිරිවැය ප්‍රතිසාධන ගාස්තුවක් අය කළ යුතු වන්නේ මෙම නියෝගවලින්, 12 වැනි නියෝගය අනුව (ආ) සහ (ඇ) යන අර්ථ දැක්වීම යටතේ ආරම්භයේ සිට ගමනාන්තය දක්වා භාණ්ඩ ප්‍රවාහනය සඳහා ය.

තව ද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශ කරනු ලබන උද්ධමනය මත පදනම්ව සෑම මාස 06කට වරක්ම නියමිත උපලේඛන 1 හි ගාස්තු සංශෝධනය කළ හැකි ය.

3. 06 වැනි නියෝගය මෙයින් ඉවත් කරනු ලැබේ.

4. පහත දැක්වෙන නිර්වචනයේ "ආරම්භයේ සිට ගමනාන්තය" යන ප්‍රකාශනයේ අර්ථ දැක්වීමෙන් පසු වහාම ඇතුළත් කිරීම මගින් පිරිවැය ප්‍රතිසාධන ගාස්තුවට අදාළ වන පරිදි ඇතුළත් වන්නේ -
   (*අ*) සෝදන ගාස්තු
   (*ආ*) පිරවුම් ඉවත් කිරීමේ ගාස්තු
   (*ඇ*) ප්‍රවාහන වියදම

5. පහත දැක්වෙන පරිදි 12 වැනි නියෝගයට පසුව වහාම උපලේඛනයේ 1 ඇතුළත් කිරීම මගින්

## 1 උපලේඛනය

## I කොටස

### *නැව්ගත ආනයන කිරීම් සඳහා උපරිම බෙදාහැරීමේ ඇණවුම් ගාස්තුව*

FCL නැව්ගත ආනයන කිරීම් සඳහා

අවසාන තොග භාරකරුවකු / ආනයනයකරුවෙකු විසින් ගෙවිය යුතු උපරිම DO ගාස්තුව (භාණ්ඩ ප්‍රවාහනය කරන ගාස්තු/ ඒකාබද්ධ කරන ගාස්තු හැර) රුපියල් 18,000.00 කි.

ඒ අනුව,

- නැව් සමාගම්වල සිට භාණ්ඩ ප්‍රවාහනය කරන්නන් දක්වා - උපරිම ලයිනර් DO ගාස්තුව රු. 14,800.00
- නැව් සමාගම්වල සිට භාණ්ඩ ඒකාබද්ධ කරන ආයතන දක්වා - උපරිම ලයිනර් DO ගාස්තුව රු. 14,800.00

LCL නැව්ගත ආනයන කිරීම් සඳහා

අවසාන තොග භාරකරුවකු / ආනයනයකරුවෙකු කරන්නෙකු විසින් ගෙවිය යුතු උපරිම DO ගාස්තුව රු. 20,500.00

ඒ අනුව,

- භාණ්ඩ ඒකාබද්ධ කරන ආයතනවල සිට භාණ්ඩ ප්‍රවාහනය කරන්නන් දක්වා - උපරිම DO ගාස්තුව රු. 16,500.00 විය යුතු ය.

## II කොටස

### *පිරිවැය අයකර ගැනීමේ ගාස්තුව*

මෙම නියෝග අඩංගු, 12 වැනි නියෝගයෙහි ආරම්භයේ සිට ගමනාන්තය යන අර්ථ නිරූපණයට යටත්ව යම් ගමනාන්තයක් දක්වා ප්‍රවාහනය කිරීම සඳහා අදාළ වන පරිදි, සේවා සපයන්නා විසින් පිරිවැය ප්‍රතිසාධන ගාස්තු ලෙස 1CB සඳහා උපරිම වශයෙන් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 8කට සමාන මුදලක් අවසාන තොගකරුගෙන් අය කළ යුතු ය.

EOG 10 - 0170

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.